**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 26 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,892.19 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,526.23 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 365.96 ක් හෙවත් සියයට 5.31 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 4,648.00 | 4,620.30 | 27.70 | 0.60 |
| මූලධන | 2,244.19 | 1,905.93 | 338.26 | 15.07 |
| **එකතුව** | **6,892.19** | **6,526.23** | **365.96** | **5.31** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂයය අංක 23201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 146.00 | 134.20 | 126.00 | 134.35 | 400.00 | 266.11 |

### 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු විෂය අංක 23202 දරන වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 80.00 | 75.54 | 90.00 | 148.90 | 12.00 | 16.18 | 50.00 | 6.43 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

විෂය අංක 23202 දරන වාණිජ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
| --- | --- | --- | --- | --- |
| | **2015** | | **2014** | |
| | **ලාභය කල්පිත ගාස්තු රහිතව** | **පාඩුව කල්පිත ගාස්තු සහිතව** | **ලාභය කල්පිත ගාස්තු රහිතව** | **ලාභය කල්පිත ගාස්තු සහිතව** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| කර්මාන්ත හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම | 50.80 | (9.51) | 49.92 | 10.35 |

## 2.3 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වූ අග්‍රිම ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල ශේෂයන්හි එකතුව රු.මිලියන 45.74 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **අග්‍රිම ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| --- | --- |
| | රු.මිලියන |
| 7002/0000/00/0078/0015/000 | 30.13 |
| 7002/0000/00/0079/0015/000 | 15.61 |
| **එකතුව** | **45.74** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 07 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 250.18 ක් වී තිබුණි. අංක 6000/0000/00/0015/0112/000 දරන තැන්පත් ගිණුමේ රු.මිලියන 8.86 ක හර ශේෂයක් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0016/000 | 12.25 |
| 6000/0000/00/0002/0017/000 | 3.33 |
| 6000/0000/00/0006/0028/000 | 4.16 |
| 6000/0000/00/0006/0081/000 | 3.97 |
| 6000/0000/00/0016/0062/000 | 225.90 |
| 6000/0000/00/0018/0075/000 | 0.57 |
| 6000/0000/00/0008/0001/000 | 4.92 |
| **එකතුව** | **255.10** |

## 2.5 විගණන නිරීක්ෂණය

----------------------

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ----------------- | ------------------ | ------------ |
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) හි 11 පරිශිෂ්ටය. | ප්‍රධාන කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ii) | වාහන ලොග් පොත්. | මුදල් රෙගුලාසි 1645(අ) | මහර බන්ධනාගාරය විසින් 2011 වර්ෂයෙන් පසු පවත්වා නොතිබුණි. |
| (iii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ප්‍රධාන කාර්යාලය විසින් විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (iv) | දෙපර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය. | මුදල් රෙගුලාසි 447 | ප්‍රධාන කාර්යාලය විසින් විධිමත්ව පවත්වා නොතිබුණි. |

### 3.2 සීමා නොපිළිපැදීම

-------------------

දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 23202 දරන වාණිජ අත්තිකාරම් ගිණුම සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ උපරිම හර ශේෂ සීමාව රු.මිලියන 12.00 ක් වි තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට හර ශේෂය රු.මිලියන 16.18 ක් වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් එම සීමාව රු.මිලියන 4.18 කින් ඉක්මවා තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම්

--------------

දෙපාර්තමේන්තුව විසින් 2016 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමකට අදාළ ශේෂය රු. 41,107 ක් වී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------

විෂය අංක 23201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි ශේෂවල එකතුව රු.8,106,545 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ ලැයිස්තුව අනුව ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීමේ දී රු.186,714 ක වෙනසක් පැවැතුණි.

(ඇ) වතුපිටිවල බන්ධනාගාරය වසා දැමීමෙන් අනතුරුව එහි නිලධාරීන් වෙනත් බන්ධනාගාර ආයතනවලට ස්ථාන මාරු කර තිබුණද, එහි පැවති රු.168,183 ක ණය ශේෂ අයවිය යුතු නිලධාරීන් හඳුනාගෙන එම ණය ශේෂ පවරා දී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ණය මුදල් අයකර ගැනිමේ දී රු.123,821 ක් වැඩිපුර අයකරගෙන තිබුණු අතර එම මුදල ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 වාණිජ අත්තිකාරම් ගිණුම්

----------------------------

විෂය අංක 23202 දරන බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) කාශ කළ වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍ර 2015 නොහැකි වූ අතර, ඉකුත් වර්ෂය සම්බන්ධයෙන්ද එපරිදි විගණන මතයක් ප්‍රකාශ කර නොතිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු 63,826,485.ක් වූ අතර එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි .

(ඇ) අත්තිකාරම් ගිණුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු 12,457,320.ක ගෙවිය යුතු ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි .

(ඈ) මහර බන්ධනාගාරයේ දිනට නිමි භාණ්ඩ තොග ලෙජර් ශේෂය හා මුලා 31 දෙසැම්බර් 2015 198,289.කාශනවල අවසන් නිමි තොග ශේෂය අතර රුප්‍රක වෙනසක් පැවැතුණි.

(ඉ) බේකරි අංශයේ හා වගා අංශයේ 8. ගැණුම් පිළිවලින් රුවාහඅමුද්‍ර (ගොවිපල),626,ක් හා 721 358.රු, ක් 252වී තිබුණි. එයට ඉන්ධන හා බලය වු රු 655,800.ක් හා රු 317,538.ක් එකතු කිරීම නිසා බේකරි අංශයේ හා වගා අංශයේ අමුද්‍රව්‍ය රු9.,282,657.ක් හා රු 521,ක් 790 .දක්වා තිබුණි ලෙස වැඩියෙන්

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i). සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල වීරවිල බන්ධනාගාරයට ලැබී තිබූ යතුරු පැදි 02 ක් හා ලොරි රථ 02 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ii). පුද්ගලික සමාගමකින් මිලදි ගත් රු.174,000 ක් වටිනා ඩිජිටල් කැමරා 12 ක් බන්ධනාගාර නේවාසිකයන්ගේ ඡායාරූප ගැනිම සඳහා භාවිතා කර නොතිබුණු අතර වෙනත් පුද්ගලික සමාගකින් මිලදීගත් රු.147,406 ක් වටිනා මයික්‍රොවේව් අවන් 14 ක් ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරිම**

වීරවිල දකුණු ඉවුර කුඩා ගම්මාන 11 හි බන්ධනාගාර වෙළඳ සැල පිහිටි පර්චස් 10 ක ඉඩම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.226,904,589 ක් වී තිබුණි. එම බැරකම් වර්ෂ 1 ක සිට වර්ෂ 5 කට අඩු කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු ශේෂවල එකතුව රු.1,452,025 ක් වී තිබුණි.

(ii). වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 9.15 ක් වී තිබුණත්, මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව එම ඉතිරිය රු.මිලියන 135.16 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

**3.7** **අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|---|
| | | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) | මුදල් රෙගුලාසි 447(4)(5) | 226,904,589 | බැරකම්, විසර්ජන සම්මත වැය ලෙජරයේ ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 757(ඇ) | - | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් කර තිබුණු ඌනතා හා නිර්දේශයන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 103 හා 104 | 13,015,000 | 2012 නොවැම්බර් 09 දින වැලිකඩ බන්ධනාගාර කැරැල්ලේදී සිදු වූ අලාභය මුදල් රෙගුලාසි 103(1) පරිදි වාර්තා නොකිරීම, 104(1)(අ) ප්‍රකාරව පරීක්ෂණ ආරම්භ නොකිරීම, 104(3) (4) ප්‍රකාරව ප්‍රථමික හා පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීම සිදුකර නොතිබුණි. |
| | (iv) | මුදල් රෙගුලාසි 102 හා 104 | 5,902,059 | වර්ෂ 10 වඩා වැඩි කාලයක සිට පැවත එන අනතුරු 77කට අදාළ එකතුව රු.4,368,716 ක අලාභයෙන් රු.1,533,343 ක්වූ වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් අතර කාල පරාසයක සිට පැවත එන වාහන අනතුරු 20 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | **බන්ධනාගාර නිත්‍ය නියෝග** | | | |
| | (i) | බන්ධනාගාර දෙපර්තමේන්තුවේ අංක 2013/13 දරන චක්‍රලේඛය | - | සිරකරුවන් නිදහස් වී යන අවස්ථාවේදී සිර වේතන ඇතුළත් බැංකු පොත් ඔවුන් වෙත භාරදිය යුතු වුවත්, සිර කරුවන් 20 දෙනෙකු නිදහස්ව යන අවස්ථාවේ වීරවිල |

බන්ධනාගාරය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ii) බන්ධනාගාර නිත්‍ය නියෝග 514, 518, 519 හා 522 | - | එකම වර්ගයේ එළවළු වර්ගයක් සතියක් තුළ දින 03 ට වඩා සැපයීම නොකළ යුතු වීම හා අළුත් මාළු ලබා දෙන විට සතියකට දින දෙකක්වත් වර්ග දෙකකින් කරවල සැපයීම සිදුකළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |

## 3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘතිය නිම නොකර අත්හැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත වියදම | ආරම්භ කළ යුතු වූ දිනය | 2015 දෙසැම්බර් 31 දින වන විට වියදම | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| මාතර කොටවිලවත්ත සිරකරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම. | 32,000,000 | 2014.11.11 | 15,958,902 | 2015 දැයට කිරුළ ප්‍රදර්ශනය හා සංවර්ධන වැඩසටහන ඉලක්ක කර ආරම්භ කර තිබුණු අතර දැයට කිරුළ ප්‍රදර්ශනය පැවැත්වීම අත්හිටුවීම මත ඉදිකිරීම් කටයුතු නවතා තිබුණි. |

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය රු. | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වනවිට වියදම රු. | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| පල්ලේකැලේ බන්ධනාගාරය ඉදිකිරිම. | 1,927,040,000 | 2007.08.15 | 2011.12.31 | නිම කර නොතිබුණි. | 1,266,088,000 | සමාලෝචිත වර්ෂය තුළ රු.307,363,208 ක **ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව ඉදිකිරීමේ නිසි සැලසුම්ගත** ක්‍රියාවලියකින් තොරව ඉදිකිරීම් සිදුකිරිම බව දන්වා තිබුණි. |

**3.9** **කාර්යසාධනය**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

බන්ධනාගාර ගතවූ නේවාසිකයින් නිදහස්ව ගිය පසු යහපත් පුරවැසියන් වශයෙන් සමාජ ගත වීමට පසුබිම සැකසිමේ අරමුණින් සිරකරු පුනරුත්ථාපනය සඳහා වෘත්තිය, අධ්‍යාත්මික හා ආගමික, අධ්‍යාපනික හා සුභසාධන, ත්‍යාග ලබාදිම, ක්‍රිඩා හා වෙනත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනවලින් රු.2,534,807 ක් සහ සිරකරු සුභසාධක අරමුදල්වලින් රු.1,907,884 ක් වැය කර තිබුණද පුනරුත්ථාපනයට අදාල ඇතැම් කාර්යය ප්‍රමාණවත් ලෙස ඉටුවී නොතිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) එක් රැඳවියෙකු සඳහා වෙන් කළ යුතු ඉඩකඩ ප්‍රමාණය වර්ග අඩි 24 ක් විය යුතුව තිබුණි. බන්ධනාගාර ආයතන 13 ක රැඳවියන් වාට්ටුවල රැඳවිය හැකි සිරකරුවන්/ සැකකරුවන් සංඛ්‍යාවෙහි සමානාය 479 ක් වියයුතු අතර පරීක්ෂණ අවස්ථා 05 කදී රඳවා සිටි සංඛ්‍යාව ඉන් දෙගුණයක් ඉක්මවා තිබුණි. සිර වාට්ටු තුළ පවතින තදබදය හේතුවෙන් රාත්‍රී කාලයේ රැදී සිටිමේ අපහසුතාව, පුනරුත්ථාපන කාර්යය විධිමත්ව සිදු නොකිරීම, පළමු වරට සිරගතවන්නන් හා නැවත නැවත සිර ගත වූවන් එකට රැඳීමෙන් පුනරුත්ථාපන කාර්යයෙහි ඵලදායි තත්ත්වය අඩු වීම, තරුණ රැඳවියන් හා අනෙකුත් රැඳවියන් එකට රැඳවීමෙන් වෙනත් සමාජ ගැටලු ඇතිවීම වැනි කරුණු විගණනයේදී නිරීක්ෂණය විය. 2007 හා 2013 වර්ෂවලදී පල්ලේකැලේ සහ තංගල්ලේ බන්ධනාගාරවල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉදිකිරීම් නිම කර නොතිබුණි.

(ii) වැඩ සහන පදනමට අනුයුක්ත කරන ලද වැඩ කණ්ඩායම්වල රැඳවියන් සඳහා සිර වේතන නිසි පරිදි ගණනය කර බැංකුගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක තුළදී රු.374,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ස්ථිර ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකිරීම මත බස්නාහිර පළාත තුළ බන්ධනාගාර විතැන් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පල්ලෙකැලේ බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු රු.360,000,000 ක ප්‍රතිපාදනවලින් රු.170,000,000 ක් හෙවත් සියයට 47 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. මේ හේතුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය අරමුණුගත කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණි.

### 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.712,809 ක් වටිනා චෙක්පත් 172 ක් මාස 06 සිට වර්ෂ 03 ක කාලයක සිට පැවැත එමින් තිබුණද, එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

### 3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කොළඹ රිමාන්ඩ් බන්ධනාගරයේ ප්‍රධාන ගබඩාවෙහි තෝරාගත් ආහාර අයිතම් 16 ක් සම්බන්ධව 2015 සැප්තැම්බර් 21 දින සිදුකරනු ලැබූ පරීක්ෂාවේදි තොග පොතට අදාළව ශේෂය හා භෞතික ශේෂය අතර අයිතම 3 ක කිලෝ ග්‍රෑම් 17.1 ක ඌනතාවක්ද අයිතම 11 ක කිලෝ ග්‍රෑම් 96.3 ක අතිරික්තයක්ද පැවතුණි.

(ආ) 2015 අගෝස්තු 27 දින මහර බන්ධනාගාරයේ ගබඩාව භෞතික පරීක්ෂාවේ ආහාර අයිතම 08 ක කිලෝ ග්‍රෑම් 11.2 ක ඌනතාවක්ද අයිතම 05 ක කිලෝ ග්‍රෑම් 7.57 ක අතිරික්තයක්ද පැවතුණි.

(ඇ) මහර බන්ධනාගාරයේ 2010, 2011 හා 2012 යන වර්ෂ සඳහා එකතුව රු.5,360,468 ක් වූ සිර චේතන සිරකරුවන්ගේ ගිණුම්වලට බැර කිරීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. වීරවිල හා තල්දෙන බන්ධනාගාරවල 2015 ඔක්තෝබර් මාසය දක්වා සිරනේවාසිකයින් වෙනුවෙන් සිර චේතන ගණනය කර නොතිබුණි.

### 3.12 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹී තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) පුහුණුවක් ලබා දීමෙන් තොරව 2013 හා 2014 හා වර්ෂ සඳහා රු.1,000,000 ක් හා 2015 වර්ෂය සඳහා රු.1,100,000 ක් බැගින් ප්‍රතිපාදන සලසා තිබුණත්, වර්ෂයකට උපකරණ 100 බැගින් ගිනි නිවීමේ උපකරණ 300 ක් මිලදී ගෙන තිබුණි. මෙම උපකරණ සඳහා වසර දෙකක වගකීම් කාලයක් ලබා දී තිබුණද කිසිදු උපකරණයක් පරීක්ෂා කර එම කාලය තුළ සේවා කිරීම් කරගෙන නොතිබුණි. 2013 හා 2014 වර්ෂවල සපයන ලද උපකරණ 200 ක් රු.649,483 ක් වැනි මුදලකට නැවත පුරවා ප්‍රයෝජනයට ගත හැකිව තිබුණද, ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ගිනි නිවීමේ උපකරණ භාවිතා කිරීම සඳහා නිලධාරීන්ට පුහුණුවක් ලබාදී නොතිබුණු අතර ඉක්ටාඩ් මාර්ගෝපදේශ ගිනි නිවාරණය පිළිබඳ උපදේශනයන් කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි.

(ආ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---------------------------------------------------------------------

වර්ෂය අවසානයේ ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැය විෂයයන් 02ක් යටතේ සලසා තිබුණු රු.194,000,000 ක ප්‍රතිපාදනවලින් සියයට 53 ක් හෙවත් රු.102,390,324 ක් ඉතිරි කර තිබුණි.

(ඇ) **අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඇස්තමේන්තුගත පිරිවැය රු.32,000,000 ක් වූ මාතර කොටුවිලවත්ත සිරකරු පුහුණු පාසැල ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.15,958,902 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) බන්ධනාගාර රැඳවියන්ගේ වැටුපෙන් සියයට 10 ක් බැගින් යොදවා බන්ධනාගාර ත්‍යාග අරමුදල ආරම්භ කර තිබුණි. මුදල් රෙගුලාසි 381(1) විධිවිධාන අනුව බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබුණි. එම අරමුදලින් 2001 - 2005 කාලපරිච්ඡේදය තුළදී ඉතිරි කිරීම් ගිණුම් එකක් හා ස්ථාවර තැන්පත් ගිණුම් 02 ක් ආරම්භ කර තිබුණු අතර ආපසු ගැනීම් කිසිවක් සටහන් වී නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පිළිවෙළින් රු.5,113,063 ක් රු.500,000 ක් හා රු.700,000 ක් වී තිබුණි.

**3.13** **පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අලාභය රු.400,000 ක් වූ 2011 සැප්තැම්බර් 23 දින අනතුරට පත්ව තිබුණු වාහනයකට සිදු වූ හදිසි අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ හේතුවෙන් වාහනය සම්පූර්ණයෙන් හානියට පත්ව ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. අනතුරට පත්වන අවස්ථාවේදී වාහනය ධාවනය කරවූ අතිරේක අධිකාරීගෙන් අලාභය රු.400,000 ක් පමණක් 2016 අප්‍රේල් 03 දින අයකරගෙන තිබුණි.

**(ආ)** මිට්ෂුබිෂි ලාන්සර් රථයක් 2013 අප්‍රේල් 11 දින අනතුරට ලක්ව අලුත්වැඩියාව සඳහා රු.400,000 ක ඇස්තමේන්තුවකට පුද්ගලික ගරාජයක් වෙත භාරදී තිබුණි. 2015 නොවැම්බර් 20 දින විට ද එම රථය අලුත්වැඩියා කර තිබුණත්, රක්ෂණ සමාගම විසින් ගෙවීමට එකඟ වී තිබුණු රු.68,750 ක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2015 ජුලි 30 දින අලුත්වැඩියාව ඉක්මණින් සිදුකර දෙන බව ඉන්දික ඔටෝ ගරාජය ලිපියක් මගින් දන්වා තිබුණද 2016 අගෝස්තු 25 දින වන විටත් රථය ගරාජයේ පවතින බව වාර්තා වී තිබුණි.

**3.14** **අනාර්ථික ගනුදෙනු**

--------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2002 වර්ෂයේ දී වැලිකඩ බන්ධනාගාරයේ පාවිච්චි කිරීමෙන් පසු ඉවත් කළ විදුලි ජනක යන්ත්‍රය වීරවිල බන්ධනාගාරයට ලබා දීමෙන් අනතුරුව රු.510,502 වැයකර අලුත් වැඩියා කර තිබුණි. විදුලි පරිපථය ස්ථාපිත කිරීම සඳහා 2010 වර්ෂයේදී රු. මිලියන 6.1 ක් කොලොන්නාව විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණද, මෙම විදුලි ජනක යන්ත්‍රය 2014 වර්ෂයේදී අපහරණ කිරීමට තීරණය කර තිබුණි. නව විදුලි ජනක යන්ත්‍රයක් ලබා දීමට මෙතෙක් කටයුතු කර නොතිබීමෙන් විදුලි පරිපථය ස්ථාපිත කිරීම සඳහා දරන ලද රු.ලක්ෂ 61 ක වියදම අනාර්ථිකව පැවතුනි.

## 3.15 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) බන්ධනාගාර ආයතනවල රැඳවියන්ගේ ඡායාරූප ලබාගෙන සිර ලියාපදිංචිය නිසිපරිදි සිදුකිරීම හා පැනයාමකදි එම ඡායාරූප පොලීසියට හා ජනමාධ්‍ය වෙත ලබාදීමට නියෝග පනවා තිබුණි. ඩිජිටල් කැමරා 32 ක් රු.464,000 කට මිලදී ගෙන තිබුණද, 2015 සැප්තැම්බර් 25 දින වන විට බන්ධනාගාර ආයතන 28 ක රැඳවියන් 93 දෙනෙකු පැනගොස් තිබුණත් ඔවුන්ගේ ඡායාරූප පොලීසිවලට හා ජනමාධ්‍යවලට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 – 2014 කාල පරිච්ඡේදය තුළ මහර බන්ධනාගාරයෙහි මිය ගිය රැඳවින් 46 දෙනෙකු සම්බන්ධව මරණ පරීක්ෂණ සිදු කර තිබුණත් පරීක්ෂණ වාර්තා ගෙන්වා ගැනීම හා ලිපිගොණු අවසන් කිරීමේ කටයුතු 2015 අගෝස්තු 27 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) ගොඩනැගිලිවලට අවශ්‍ය දොර ජනෙල් සවිකිරීම වෙනුවෙන් 2015 ජූලි 21 දින රු.248,487 ක් ගෙවා තිබුණි. 2015 නොවැම්බර් 30 දින වන විටත් ඉදිකිරීම් සම්පූර්ණයෙන් අවසන් කර යන්ත්‍ර සවි නොකිරීම හේතුවෙන්, පුද්ගල හා පාර්සල් පරීක්ෂා කිරීමේ යන්ත්‍ර ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) මහර බන්ධනාගාරය සතු අබලන් තත්ත්වයේ පැවති නිල නිවාස 9 ක් අලුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) අත්ට්‍රැක්ටරයක් (CENT වර්ගය 2010 වර්ෂයේ සිට අබලන්ව) හා තවත් අත්ට්‍රැක්ටරයක් 2012 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යස්ථාන භූමියේ ගාල් කර තිබුණත්, එම වාගන 2016 සැප්තැම්බර් මාසය දක්වා අභාවිතව පැවතුණි.

(ඊ) ඔටෙක්ස් විදුලි ජනක යන්ත්‍රය තල්දෙන බන්ධනාගාරයේ වඩු අංශය අසල ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

(උ) 2012 වර්ෂයේ සිට 2014 සැත්තැම්බර් 10 දින දක්වා තල්දෙන බන්ධනාගාරයේ පැනගිය සිරකරුවන් අතුරින් 07 දෙනෙකු සොයා ගැනීමට 2015 නොවැම්බර් මාසය වන විටත් නොහැකි වී තිබුණි.

(ඌ) තල්දෙන බන්ධනාගාරයේ වඩු අංශය හා පැස්සුම් අංශය තුළ නේවාසිකයින්ගේ කාර්යයන් පිළිබඳ කටයුතු කිරීමට පරිපාලකයකු පත් කර නොතිබුණි.

(එ) තල්දෙන කර්මාන්ත අංශය හා කෘෂිකාර්මික නිෂ්පාදන වෙනත් ආයතන සඳහා නිකුත් කර තිබුණත්, එම නිෂ්පාදනවලට අයවිය යුතු රු.196,231 ක් වටිනා බිල්පත් 07 ක් 2016 සැප්තැම්බර් මාසය වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 95 | 48 | 47 |
| (ii) | තෘතියික මට්ටම | 6,864 | 5,341 | 1,521 |
| (iii) | ද්විතියික මට්ටම | 494 | 297 | 197 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 369 | 331 | 36 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 04 | - |
| | **එකතුව** | **7,822** | **6,021** | **1,801** |

ඉහත පරිදි පුරප්පාඩු පැවතීම හේතුවෙන් බන්ධනාගාර ආයතනවල රාජකාරි ඉටු කිරීමේදී විවිධ ගැටළු මතු වී තිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) තල්දෙන බන්ධනාගාරයෙහි 2015 සැප්තැම්බර් 30 දිනට නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 63 ක් වූ අතර, එම පුරප්පාඩු සම්පූර්ණ නොවීම හේතුවෙන් කෘෂිකාර්මික, වඩු හා පැස්සුම් අංශවල කටයුතු කාර්යක්ෂමව කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) විශාල වපසරියකින් යුතු පල්ලේකැලේ බන්ධනාගාරය වටා ආරක්ෂාවට තාප්පයක් හෝ වැටවල් ඉදිකර නොතිබුණු අතර ආරක්ෂාවට මුර පොලවල් 28 ක් ස්ථාපිත කර තිබුණි. මුර පොලවල්වලට යෙදීමට අවශ්‍ය තරම් නිලධාරීන් සංඛ්‍යාවක් බන්ධනාගාරය සතුව නොපැවතුණි.

(ඇ) අධික උසාවි ප්‍රමාණයක් ආවරණය වන සිරකරුවන් රඳවා තබන බන්ධනාගාරයක් වන තංගල්ල බන්ධනාගාරයේ නිලධාරීන් හිඟ තාවය හේතුවෙන් උසාවි සඳහා රැඳවියන් රැගෙන යැමේදී ගැටළු සහගත තත්ත්වයකට මුහුණ දීමට සිදුවන බව නිරීක්ෂණය විය.

(ඈ) බදුල්ල බන්ධනාගාරයට බදුල්ල හා නුවර එළිය අධිකරණ කළාපවල අධිකරණ 10 ක පමණ රාජකාරී පැවරී තිබුණු අතර නිලධාරී පුරප්පාඩු අධිකව පැවතීම හේතුවෙන් බන්ධනාගාරවල ආයතනික හා පරිපාලන කටයුතුවල දුර්වලතා පැවති අතර ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක්ද පැවතුණි.